GMOA
ESTABLISHED IN 1926
TU No. 291
THE GOVERNMENT MEDICAL OFFICERS' ASSOCIATION
No.275/75, Professional Centre, Prof. Stanley Wijesundara Mawatha, Colombo 07
Tel : 2580886 / 0714 999555
Fax : 4518668 / 2503586
Web : www.gmoa.lk
Email : info@gmoa.lk
office@gmoa.lk

**16.10.2015**

## මාධ්‍ය නිවේදනයයි.

**2016 අයවැය සම්බන්ධව රජයේ වෛද්‍ය නිලධාරීන්ගේ මතය වැටුප් කොමිෂන් සභාවට දැනුම් දෙයි.**

රජයේ වෛද්‍ය නිලධාරීන්ගේ සංගමය සහ ජාතික වැටුප් කොමිෂන් සභාව අතර 2016 අයවැය සම්බන්ධව තිරණාත්මක සාකච්ජාවක් 2015.10.15 දින පැවතුණි. ඒ සඳහා රජයේ වෛද්‍ය නිලධාරීන්ගේ සංගමයේ සභාපතිතුමා, ලේකම් තුමා ඇතුළු විධායක කමිටු සාමාජික පිරිසක්ද වැටුප් කොමිෂන් සභාව වෙනුවෙන් එහි සම සභාපතිවරුන් සහ ලේකම්තුමාද සහභාගි විය.

මෙහිදී අප සංගමය ජාතික වැටුප් කොමිෂන් සභාවට පහත කරුණු අවධාරණය කරණ ලදි.

1. 2015 අය වැයේදී ජාතික වැටුප් ප්‍රතිපත්තියට අනුව වැඩි කරන ලද මූලික වැටුප් වැඩිකිරීම සියලුම රජයේ සේවකයින්ට ලබා දිය යුතු බව.
2. 2016 අයවැය මඟින් සියලුම රාජ්‍ය සේවකයින්ගේ මූලික වැටුප වැඩි කල යුතු අතර එය ජාතික වැටුප් ප්‍රතිපත්තියකට අනුකූලව සිදුවිය යුතුය.
3. රජයේ වෛද්‍යවරුන්ට වැටුප් කොමිෂන් සභාවේ අනුමැතිය සහිතව ලබා දී ඇති සියලුම දීමනා කඩිනමින් ලබා දීමට කටයුතු කළ යුතු බව
4. සියලුම රාජ්‍ය සේවකයින් සඳහා දීමනා සහ වැටුප් වර්ධක ප්‍රතිපත්තියක් ක්‍රියාත්මක කළයුතු බව.
5. 06/2006 චක්‍ර ලේකයට අනුව සිදු කෙරුණු වෛද්‍යවරුන්ගේ සේවා ව්‍යවස්ථාවට ගැලපෙන පරිදි වැටුප් සඳහා අන්තර් ග්‍රහන ව්‍යුහයක් ක්‍රියාත්මක කළ යුතුය.

මෙහිදී, මේ සඳහා ගත යුතු ක්‍රියාමාර්ග ගැනීමටත් 2016 අයවැය යෝජනා තුළට මෙම යෝජනා නිර්දේශ කිරීමට සලකා බැලීමටත් තීරණය විය.

ස්තූතියි

වෛද්‍ය නලින්ද හේරත්
ලේකම්

වැඩිදුර විස්තර: වෛද්‍ය නවින්ද සොයිසා 0718582444
වෛද්‍ය හරිත අලුත්ගේ 0718121619